# 10. ජේසුතුමාගේ ජයමඟ (2)

ජේසුතුමාගේ ශරීරය කුරුසයෙන් බා ගල්ලෙනක තැන්පත් කළා. දින තුනක් ගත වුණා. එදා ඉරිදා දවසක්. මරිය මග්දලේනා සහ තවත් කාන්තාවන් කිහිප දෙනෙක් එම ගල්ලෙන ළඟට ගියා.

ජේසුතුමාගේ ශරීරය ගල්ලෙන තුළ තිබුණේ නෑ. ඔවුන් බිය වුණා. වටපිට බැලුවා. සුදු ඇඳුම් ඇඳගත් දෙදෙනෙක් 'මරණය ජය ගත් ජේසුතුමා ගල්ලෙන තුළ සොයන්නේ ඇයි?' කියා ඔවුන්ගෙන් ඇසුවා.





මරණය ජය ගෙන උත්ථාන වූ ජේසුතුමා ගෝලයන් මැදට ආවා. 'ඔබට සාමය වේවා!' කියා ඔවුනට පැතුවා. ගෝලයන් සතුටට පත් වුණා. පසු කලක ඔවුන් ජේසුතුමා ඉගැන් වූ දේ බය නැතුව සෙනගට දේශනා කළා.



## පැවරුම්

වරහන් තුළින් හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න. එම වාක්‍ය අභ්‍යාස පොතෙහි ලියන්න

(සාමය, මරිය මග්දලේනා, උත්ථාන)

1. ..................................ජේසුතුමා බලන්න ගල්ලෙන ළඟට ගියා.
2. ජේසුතුමා මරණයෙන් පසු..........................වුණා.
3. ජේසුතුමා ගෝලයන්ට......................වේවා! යි කීවා.